ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA


මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025.12.16

පැමිණිලි පාර්ශවය : ජේ.ස්ටාර්ලින් මයා
ගුරු විදුහල්පති වෘත්තිය සමිති එකමුතුව,
65/4 ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.

වගඋත්තරකරුවන් : 1) රංජිත් සෝමවංශ මයා
බස්නාහිර පළාත් අධ්‍යාපන,සංස්කෘතික, කලා කටයුතු සහ යෞවන කටයුතු හා තොරතුරු තාක්ෂණය පිළිබඳ අමාත්‍ය (හිටපු)
පළාත් සභා ගොඩනැගිල්ල, 2වන මහල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල.

2) එස්.ජී. විජේබන්දු මයා
හිටපු ලේකම්,
බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යංශය,
පළාත් සභා ගොඩනැගිල්ල, 2වන මහල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල.

2 (a) ලේකම්,
බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යංශය,
පළාත් සභා ගොඩනැගිල්ල, 2වන මහල,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත
බත්තරමුල්ල.

3) පී. ශ්‍රීලාල් නෝනිස් මයා
හිටපු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක,
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
නො. 89, කඩුවෙල පාර, රන්මගපාය
බත්තරමුල්ල.


ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

3 (ඔ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක,
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
නො. 89, කඩුවෙල පාර, රන්මගපාය
බත්තරමුල්ල.

4) විමල් ගුණරත්න මයා
හිටපු අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ
බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
නො. 89, කඩුවෙල පාර, රන්මගපාය
බත්තරමුල්ල.

**පැමිණිලි අංකය : HRC/2986/16**

**පැමිණිල්ල :-**

ඉහත පැමිණිලිකරු විසින් 2016.08.03 වන දින ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින් කරුණු දක්වා ඇත්තේ එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන,සංස්කෘතික, කලා කටයුතු, යෞවන කටයුතු හා තොරතුරු තාක්ෂණය පිළිබඳ අමාත්‍යවරයා විසින් රජයේ පාසල්වලට අදාළ පරිපාලන නීති උල්ලංඝනය කරමින්, ජාතික ප්‍රතිපත්තියට පටහැනිව, බස්නාහිර පළාතේ ජනප්‍රිය පාසල් 21ක පළමු ශ්‍රේණිය සඳහා අමතර පන්තියක් වැඩි කරන ලෙස අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විමල් ගුණරත්න මහතා වෙත ලිඛිතව නියෝග කර ඇති බවට තමන්ට දැනගන්නට ලැබුණු බවයි. මෙය පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීමක් මත සිදු කර ඇති බවත් එම තීරණය ක්‍රියාත්මක වුවහොත් එය අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රඥාගෝචර නොවන හා දේශපාලනඥයින් සඳහා පාසල් වලට ළමුන් ඇතුළත් කිරීමට ඇති ඉඩකඩ වැඩි කරන තීරණයක් බැවින් බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යවරයාගේ උක්ත නියෝගය ක්‍රියාත්මක කිරීම වලක්වන ලෙසට කොමිෂන් සභාව වෙතින් ඉල්ලා ඇත.

බස්නාහිර පළාත් සභාවේ ජනප්‍රිය පාසල් 21ක් සඳහා 2016 වසරේ පළමු වන ශ්‍රේණිය සඳහා අමතර සමාන්තර පන්තියක් පැවැත්වීමට තීරණය කර ඇති බැවින්, මෙම ක්‍රියාදාමය නිසා බස්නාහිර පළාත් සභාවේ අවට තිබෙන කුඩා පාසල් වැසී යාමේ තර්ජනයකට මුහුණ දීමට සිදු වන බවද පෙන්වා දී ඇත. මෙම සමාන්තර පන්ති ඇති කිරීම මෙම පාසල් තුළ ක්‍රියාත්මක කරනු ලබන්නේ විධිමත් ක්‍රියාපටිපාටියක් අනුගමනය නොකර බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ දැනුම් දීම මත පමණක් බවත් එබැවින් ඒ පිළිබඳව විමර්ශනයක් කරන මෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙතින් පැමිණිලි පාර්ශවය ඉල්ලා ඇත.

**පැමිණිලිකරුගේ කරුණු දැක්වීම :-**

පැමිණිලි පාර්ශවය විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට වාචිකව හා ලිඛිතව කරුණු දක්වමින් ප්‍රකාශ කර ඇත්තේ බස්නාහිර පළාතේ තෝරාගත් ජනප්‍රිය පාසල් 21ක පළමුවන ශ්‍රේණිය

සඳහා පන්තියක් වැඩි කිරීම පිළිබඳව එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යතුමා විසින් බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (වැ.බ) විමල් ගුණරත්න මහතා වෙත නියෝගයක් ලබා දී ඇති බවයි. ඒ සම්බන්ධයෙන් විමල් ගුණරත්න මහතා විසින් බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා අමතා ඇති 2016.08.01 දිනැති ලිපිය මඟින් ජනප්‍රිය පාසල්වල පළමුවන ශ්‍රේණිය සඳහා පන්තියක් වැඩි කිරීම පිළිබඳව බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යතුමාගේ තීරණය සුදුසු නොවන බව හා එම තීරණය රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට බාධාවක් වන බවට කරුණු දක්වා ඇති බවයි. එසේම 2016.08.01 වන දින වන විට බස්නාහිර පළාත් සභාව තුළ පාසල් නොමැති ළමුන් නොසිටින බවටත් මෙම පළාත් සභාව තුළ කුමන හෝ පාසලක් සෑම ළමයෙකුටම ලැබී ඇති බවටත් එම ලිපියෙන් කරුණු දක්වා ඇති බවයි. තවද 2016 මැයි මස බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යතුමා විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් සමඟ පැවති සාකච්ඡාවකදී ඔවුන්ගෙන් විමසා සිටි අවස්ථාවේ තම පළාත් සභාව තුළ පාසලක් නොමැති ළමුන් නොමැති බවත් සෑම දරුවෙකුට කුමන හෝ පාසලක් මේ වන විට ලැබී ඇති බවත් යන්න එහි සඳහන් කර ඇති බවයි.

එසේ තිබියදීත් එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම් එස්.ජී.විජයබන්දු මහතා විසින් 2016.08.30 වන දින බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරුන්ගේ තීරණයක් සහ පළාත් අධ්‍යාපන අමාත්‍යතුමාගේ ඉල්ලීමක් මත 2016 වසරේ පළමු වන වසරට සමාන්තර පන්තියක් වැඩි කිරීමට තීරණය කර ඇති බවට කරුණු දක්වා ඇත. ඒ අනුව එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක ශ්‍රීලාල් නොනිස් මහතා විසින් බස්නාහිර පළාත් සභාව තුළ පාසලක් නොමැති දරුවන් සඳහා සමාන්තර පන්තියක් වැඩි කිරීමට උපදේශක කාරක සභාව තීරණය කර ඇති බැවින් තෝරා ගත් පාසල් 21කට සමාන්තර පන්ති ආරම්භ කරන ලෙසට 2016.09.02 වන දින කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් වෙත ලිපි මගින් දන්වා ඇති බවයි. ජනප්‍රිය පාසැල්වල මෙවැනි සමාන්තර පන්ති පැවැත්වීම තුලින් බස්නාහිර පළාත් සභාවේ පවතින කුඩා පාසල් වැසී යාමේ තර්ජනයකට මුහුණ දීමට සිදු වන බවත් එවකට රජය විසින් ප්‍රතිපත්තිමය වශයෙන් ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ ළඟම පාසල හොඳම පාසල කිරීමේ ප්‍රතිපත්තියට පටහැනිව බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා කටයුතු කර ඇති බවත් පෙන්වා දී ඇත. මේ පිළිබඳ මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ විමර්ශනයක් සිදුකර සාධාරණය ඉටු කර දෙන මෙන් පැමිණිලි පාර්ශවය විසින් ඉල්ලා ඇත. තවද 2016 වසරේ පළමු වන ශ්‍රේණියට ඇතුළත් කර ගන්නා ලද ළමුන් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගන්නා ලෙසද පැමිණිලිකාර පාර්ශවය කොමිෂන් සභාව වෙතින් ඉල්ලා ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

<u>2 වන වගඋත්තරකරු වන එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් එස්.ජී.විජේබන්දු මහතාගේ කරුණු දැක්වීම</u>

එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම්ගේ 2016.09.15 දිනැති වාර්තාවෙන් හා 2017.09.19 වන දින මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණ අවස්ථාවේදී 2වන වගඋත්තරකරු

වෙනුවෙන් පෙනී සිටි නියෝජ්‍ය අධ්‍යක්ෂ ඒ.ඒ.ඩී.එම්. විජේතුංග මහතා විසින් පැමිණිල්ලට අදාළව කරුණු දක්වා ඇත. ඒ අනුව පළමු වසරට පන්තියක් වැඩි කිරීමේ හැකියාවක් තිබෙන බවත් නියමිත ක්‍රමවේදයට ආරම්භ කළ හැකි බවටත් කොමිෂන් සභාව වෙත කරුණු දක්වා ඇත. තවද මහජන නියෝජිතයින්, පළාත් සභා මන්ත්‍රීන්, අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින්, දේශපාලනඥයින් සහ ළමුන්ගේ දෙමව්පියන්ගේ ඉල්ලීම් අනුව 2016.08.30 වන දින පැවති උපදේශක කාරක සභාවේ ගන්නා ලද තීරණයක් මත පෝෂිත කලාපයේ පාසලක් නොමැති ළමුන්ට සමාන්තර පන්තියක් ඇති කිරීමට කටයුතු කළ බවත්ය. අධ්‍යාපන අමාත්‍යාංශයේ 23/2013 දිනැති චක්‍රලේඛනය ප්‍රකාරව සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත්ව සුදුසුකම් සපුරන ළමුන් සිටින්නේ නම් එකී පාසල සඳහා නියමිත ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් සමාන්තර පන්තියක් ආරම්භ කිරීමට අනුමත කරමින් 2016.09.02 දින බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම් විසින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරයාට දැනුම් දී ඇති බවත් වැඩි කරන පන්තියේ උපරිම සිසුන් සංඛ්‍යාව එසේ සුදුසුකම් ලත් ළමුන් සංඛ්‍යාවට සීමා විය යුතු බවටද එම ලිපියෙන් දන්වා තිබූ බවයි.

<u>3වන වගඋත්තරකරු වන එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ශ්‍රීලාල් නෝනිස් මහතාගේ කරුණු දැක්වීම</u>

3වන වගඋත්තරකරු වන එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ශ්‍රීලාල් නෝනිස් මහතා විසින් 2017.09.19 දින කොමිෂන් සභාව හමුවේ පැවති පරීක්ෂණයේදී ප්‍රකාශ කර ඇත්තේ 2016.08.30 වන දින පැවති බස්නාහිර පළාත් අධ්‍යාපන උපදේශක කාරක සභාවේදී ගත් තීරණයක් අනුව අසාධාරණයට පත්වූ දරුවන් වෙනුවෙන් 2016 වසරේ පළමු වසරට සමාන්තර පන්තියක් වැඩි කිරීමටත්, ඒ අනුව සියලු පාසල් වලට පන්තියක් ආරම්භ කිරීමට නොහැකි නිසා තෝරාගත් පාසල් සඳහා පමණක් එම දරුවන් සීමා වන පරිදි පළමු ශ්‍රේණියට නව පන්තියක් ආරම්භ කිරීමට උපදේශක කාරක සභාවේදී තීරණය කරන ලද බවය. උපදේශක කාරක සභාවේදී පළාත් සභා මන්ත්‍රීවරුන් මතු කරන ලද කාරණාව වූයේ මධ්‍යම රජයේ පාසල් වල ළමුන් 39 සීමාව ඉක්මවා ළමුන් ඇතුළත් කර ගෙන ඇති නිසා පළාත් සභා පාසල්වලටද මේ සඳහා අවස්ථාව ලබාදිය යුතු බවටය. ඒ අනුව බස්නාහිර පළාත් සභාව තුළ ජනප්‍රිය පාසල් වල සමාන්තර පන්තියක් වැඩි කිරීමත් එහිදී චක්‍රලේඛනය උල්ලංඝනය නොවන ආකාරයෙන් පන්තියක් වැඩි කිරීම සුදුසු බවටත් උපදේශක කාරක සභාවේදී තීරණය වූ බවය. ඒ අනුව අධ්‍යාපන ලේකම්තුමාගේ 2016.09.02 දිනැති ලිපිය මගින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් හරහා තෝරා ගත් පාසල් 21කින් එම සමාන්තර පන්ති ඇති කිරීමට නියමිතව තිබුණේ ජනප්‍රිය පාසල් 18ක් සඳහා පමණක් බවට කරුණු දක්වා ඇත. එයට හේතුව අසාධාරණයට ලක් වූ දරුවන් ඉල්ලීම් කළ පාසල් පමණක් ඒ සඳහා සලකා බලන ලද බවයි. එසේ සමාන්තර පන්තියක් වැඩි කිරීමට තීරණය කරනු ලැබුයේ අසාධාරණයට පත්වූ දරුවන්ට සාධාරණයක් ඉටු කර දීම සඳහා බවත්ය. එසේම බස්නාහිර පළාත් සභාවේ 2016 වසරේ පමණක් නොව දීර්ඝ කාලයක් තිස්සේ එසේ පන්ති වැඩි කිරීමක් සිදු කර ඇති බවටත් කරුණු දක්වා ඇත. මෙය 2016 වසරට පමණක් සීමා වන ලෙස පන්තියක් වැඩි කිරීමට තීරණය කරන ලද්දක් බවත්

2017 වසරට මෙවැනි ගැටලුකාරී තත්ත්වයක් ඒ වන තෙක් උදා වී නොමැති බවටත් 3 වන වගඋත්තරකරු කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත.

**<u>04 වන වගඋත්තරකරු වන එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විමල් ගුණරත්නගේ මහතාගේ කරුණු දැක්වීම</u>**

4වන වගඋත්තරකරුගේ 2016.09.06 දිනැති වාර්තාවෙන් පැමිණිල්ලට අදාළව මෙම කොමිෂන් සභාව වෙත කරුණු දක්වා ඇත්තේ, බස්නාහිර පළාතේ පාසල්වල පළමු වන ශ්‍රේණිය සඳහා ළමයින් ඇතුළත් කිරීමේ දී ඇතැම් පාසල්වල පවතින අධික තදබදය හේතුවෙන් සහ තවදුරටත් පළමුවන ශ්‍රේණිය සඳහා ඇතුළත් නොවූ ළමයින් බොහෝ සංඛ්‍යාවක් ඇති බවට බස්නාහිර පළාත් අමාත්‍ය මණ්ඩලය හා මන්ත්‍රීවරුන් විසින් ඉල්ලීම් කර ඇති බව සඳහන් කරමින් එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍ය රංජිත් සෝමවංස මහතා විසින් තදබදය පවතින පාසල්වල පළමුවන ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම යන හිසින් යුතු 2016.07.25 දිනැති ලිපිය මගින් බස්නාහිර පළාතේ තෝරාගත් පාසල් 21ක 2016 වර්ෂයට පළමුවන ශ්‍රේණියේ අමතර පංතියක් ලබාදීම අනුමත කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස තමා වෙත දන්වා තිබූ බවයි. එසේම බස්නාහිර පළාත් ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/02/22/02 හා 2016.08.01 දිනැති ජනප්‍රිය පාසල්වල පළමුවන ශ්‍රේණිය සඳහා පන්තියක් වැඩි කිරීමේ බස්නාහිර පලාත් අධ්‍යාපන අමාත්‍යවරයාගේ තීරණය නතර කරන ලෙස ඉල්ලීම යන හිසින් යුතු ලිපිය මගින් මෙම කරුණ සම්බන්ධ සවිස්තර වාර්තාවක් ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කරන ලෙස ද තමා වෙත දන්වා තිබූ බවය.

ඒ අනුව ජනප්‍රිය පාසල්වල පළමුවන ශ්‍රේණිය සඳහා සමාන්තර පංතියක් වැඩි කිරීමේ බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යවරයාගේ තීරණය සුදුසු නොවන බව හා එම තීරණය රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමටද බාධාවක් වන බවට කරුණු සහිත වාර්තාවක් තමා විසින් බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා වෙත යොමු කළ බවත් එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති බවටත් එම වාර්තාවෙන් කරුණු දක්වා ඇත.

**<u>කොමිෂන් සභාව හමුවේ අනාවරණය වී ඇති කරුණු :-</u>**

දෙපාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත වාචික හා ලිඛිතව ඉදිරිපත් කරන ලද කරුණු අධ්‍යනය කිරීමේදී පැහැදිලි වන්නේ 2016.07.27 වන දින පැමිණිලිකාර පාර්ශවය විසින් එවකට බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයාට කරන ලද පැමිණිල්ලක් (ජනප්‍රිය පාසල්වල පළමු ශ්‍රේණිය සඳහා පන්තියක් වැඩි කිරමේ බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යවරයාගේ තීරණය නතර කරන ලෙස) ප්‍රකාරව ආණ්ඩුකාරවරයා විසින් 2016.08.01 දිනැති ලිපිය මගින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරයාගෙන් ඒ පිලිබඳ සවිස්තර වාර්තාවක් ඉල්ලා ඇති බවය. එම වාර්තාව මඟින් ජනප්‍රිය පාසල්වල පළමු ශ්‍රේණිය සඳහා සමාන්තර පන්තියක් වැඩි කිරීමේ බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යවරයාගේ තීරණය සුදුසු නොවන බව හා එම තීරණය රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට

බාධාවක් වන බවට අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විමල් ගුණරත්න මහතා විසින් පළාත් ආණ්ඩුකාර වෙත කරුණු වාර්තා කර ඇත.

තවද 2016 මැයි මස බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් සඳහා පවත්වනලද රැස්වීමේදී බස්නාහිර පළාතේ 2016 වර්ෂයට පාසලක් නොමැති ළමුන් නොමැති බවට කරුණු දක්වා ඇති බවද අනාවරණය වේ. මේ සම්බන්ධව බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා වෙන වෙනම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන්ගෙන් විමසා ඇත. 2016.07.25 වන දින පළාත් රාජ්‍ය ගිණුම්කාරක සභාවේදීද පන්ති වැඩි කිරීමක් සම්බන්ධව සාකච්ඡා කිරීමේදී එවැනි තත්ත්වයක් ඇති නොකරන ලෙස පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් දැනුවත් කර ඇත. තවද 2016.08.01 දින අධ්‍යාපන අමාත්‍යාංශයේ පැවති පළාත් අධ්‍යාපන ලේකම්වරුන්ගේ රැස්වීමේදී පළමු ශ්‍රේණියට සමාන්තර පන්තියක් වැඩි නොකරන ලෙසට අධ්‍යාපන අමාත්‍යතුමා විසින් බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම් වෙත දැනුම් දී ඇති බවට කරුණු ඉදිරිපත් වී ඇත.

ඉහත කරුණු එසේ තිබියදීත් එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් එස්.ජී.විජයබන්ඩු මහතා විසින් 2016.09.02 දිනැති ලිපිය මගින් මෙතෙක් පාසලක් නොලද එහෙත් අදාළ පාසලේ පෝෂිත ප්‍රදේශයේ පදිංචි, අධ්‍යාපන ලේකම්ගේ 23/2013 චක්‍රලේඛ ප්‍රකාරව සම්මුඛ පරීක්ෂණයකට ඉදිරිපත්ව සුදුසුකම් සපුරන ලද සිසු දරුවන් වේ නම් එකී පාසල සඳහා විධිමත් පටිපාටියක් අනුගමනය කරමින් සමාන්තර පන්තියක් ආරම්භ කිරීමට අනුමැතිය දෙමින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක වෙත ලිඛිතව දන්වා ඇත. එදිනම බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක ශ්‍රීලාල් නෝනිස් මහතා විසින් බස්නාහිර පළාත් සභාව තුළ තෝරාගත් ජනප්‍රිය පාසල් වල පන්තියක් වැඩි කරන ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරු වෙත ලිපි නිකුත් කර ඇති බවට කරුණු අනාවරණය වේ.

වගඋත්තරකාර පාර්ශවය දිගින් දිගටම කරුණු දක්වා ඇත්තේ දෙමව්පියන්, මහජන නියෝජිතයන්, පළාත් සභා නියෝජිතයන්, දේශපාලනඥයින්ගේ ඉල්ලීම මත 2016.08.30 දින පැවති උපදේශ කාරක සභාව විසින් තීරණය කර මේ වන විටත් පාසලක් නොලද පෝෂිත කලාපයේ ළමුන් වෙනුවෙන් අමතර සමාන්තර පන්තියක් ආරම්භ කිරීමට කටයුතු කරන ලද බවය. අධ්‍යාපන ලේකම් විසින් 2013.05.23 දින නිකුත් කරන ලද 23/2013 චක්‍රලේඛනය ප්‍රකාරව පෝෂිත කලාපය තුළ පාසලක් නොමැති ළමුන් සඳහා සමාන්තර පන්තියක් ආරම්භ කිරීමේ ක්‍රියාපටිපාටිය අනුගමනය නොකර සමාන්තර පන්තියක් ආරම්භ කිරීමට 2016.09.02 දාතම ලිපියකින් බස්නාහිර පළාත් අධ්‍යාපන ලේකම්වරයා විසින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරයා වෙත නියෝග ලබා දී ඇති බවට කරුණු නිරීක්ෂණය වේ. එහි සඳහන් වන්නේ 2016 වසරේ සමාන්තර පන්තියක් වැඩි කිරීම සුදුසුකම් ලත් සිසුන් සංඛ්‍යාවට සීමා විය යුතු බවයි. එසේ වුවත් බස්නාහිර පළාත් සභාව තුළ

නියමිත ක්‍රියාපටිපාටිය යටතේ සමාන්තර පන්ති ආරම්භ නොකර දරුවන් ඇතුළත් කර ගැනීම සිදුව ඇති බවට දෙපාර්ශවයේ කරුණු හා ලේඛන අනුව අනාවරණය වේ.

බස්නාහිර පළාතේ පාසල් 21ක පන්ති වැඩි කරන ලෙස එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන ඇමතිතුමා විසින් කර ඇති නිර්දේශයට අනුව එම පාසල්වලට දරුවන් ඇතුළත් කර ඇත්තේ දරුවන් ඇතුළත් කිරීම සඳහා හා සමාන්තර පන්ති වැඩි කිරීම සඳහා වූ විධිමත් ක්‍රමවේදයන්ගෙන් බැහැරව බවට පැහැදිලිව නිරීක්ෂණය වේ. අධ්‍යාපන අමාත්‍යාංශයේ 23/2013 චක්‍රලේඛය ප්‍රකාරව පළමුවන ශ්‍රේණියේ සමාන්තර පන්තියක් ඇති කිරීමේ සාමාන්‍ය ක්‍රමවේදය වන්නේ ළමයින් 30 දෙනෙකු ප්‍රථම සම්මුඛ පරීක්ෂණයෙන්ද එම 30 දෙනාත් සමඟ තවත් ළමයින් තිදෙනෙකු අභියාචනා හා විරෝධතා පරීක්ෂණයෙන්ද වශයෙන් ළමයින් 33 දෙනෙක් තෝරාගත යුතු අතර ඊට අමතරව ළමයින් 7 දෙනෙකු ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටින හෝ යෙදී සිටි ත්‍රිවිධ හමුදාවේ හා පොලිස් සාමාජිකයන්ගේ දරුවන්ගෙන් ආරක්ෂක අමාත්‍යාංශයේ නිර්දේශ මත තෝරාගනු ලැබීමයි. ඒ අනුව මුළු සංඛ්‍යාව 40කි යනුවෙනි. මේ අනුව දේශපාලන බලපෑම මත පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් යොමු කරන ලද සිසුන්ගේ නම් සඳහන් ලැයිස්තුවක් මත පමණක් පදනම්ව එම සිසුන්ව අදාළ පාසැල්වලට ඇතුළත් කර ගැනීමට කටයුතු කර ඇති බවට කරුණු අනාවරණය වේ.

තවද එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විමල් ගුණරත්න මහතා විසින් බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයා අමතා ඇති 2016.08.01 දින ලිපිය ප්‍රකාරව ඒ වන විට පාසල් නොමැති ළමුන් නොමැති බව අනාවරණය වී තිබිය දී හා බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා සමඟ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් පැවති රැස්වීමකදී ඔවුන්ගෙන් වෙන වෙනම කරුණු විමසීමේදී තම කලාපය තුළ 2016 වසර අගොස්තු වන විට පාසලක් නොමැති ළමුන් නොමැති බවට වාර්තා වී තිබිය දීත් 2016.09.02 දින වන විට එවැනි පාසල් 21ක් ඇති බවට නිගමනය කර එයින් 18කට ළමුන් ඇතුළත් කිරීමට කටයුතු කර ඇති බවට කරුණු අනාවරණය වේ.

මෙලෙස නීත්‍යානුකූල නොවන ආකාරයට බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ තෝරාගත් පාසල් 18ටම පාසලක් නොමැති ළමුන්ගේ නාම ලේඛනය ඉදිරිපත් කරනු ලබන්නේ බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක ශ්‍රීලාල් නෝනිස් මහතා විසින් බවට කරුණු අනාවරණය වී ඇත. මේ අනුව බස්නාහිර පළාත තුළ දේශපාලනඥයින්ගේ ඉල්ලීම් ඉටු කිරීමට එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය කටයුතු කර ඇති ආකාරය ඉහත කරුණු අනුව නිරීක්ෂණය වේ. එවැනි සමාන්තර පන්තියක් ජනප්‍රිය පාසල්වල ඇති කිරීම තුළින් එම පළාත තුළ පිහිටවූ කුඩා පාසල් වැසී යාමේ තර්ජනයකට මුහුණදීමට සිදුවන අතර මෙම ක්‍රියාවලිය තුළ මෙම ජනප්‍රිය පාසල් අවට නාගරික තදබදය වැඩි වී මිනිසුන්ට පීඩාකාරි තත්වයක් මතුවන බවද නිරීක්ෂණය වේ.

තවද වගඋත්තරකරුවන්ගේ ප්‍රකාශ අනුව පෙනී යන්නේ දීර්ඝ කාලයක් තිස්සේ මෙසේ නීත්‍යානුකූල නොවන ආකාරයට පාසැල්වලට ළමුන් ඇතුළත් කිරීම කර ඇති බවයි. ඒ අනුව එම පාසල් වල ප්‍රමාණවත් මානව සම්පත් සහ භෞතික සම්පත් නොමැතිව තිබියදීත් මෙසේ ළමුන් ඇතුළත් කිරීම

නිසා එම පාසල් තුළ අධ්‍යාපනය ලබමින් සිටින දරුවන් පීඩාවට පත්වීමටද එය හේතු වේ. තවද පළාතේ ජනප්‍රිය පාසල් වල සිටින ගුරුවරුන් හා සම්පත් අනෙකුත් පාසල් වලට නොලැබීම නිසා ජනප්‍රිය පාසල් තුළ තදබදයක් ඇති වීමත් කුඩා පාසල් දිනෙන් දිනම වැසීයාමේ අවධානමට පත් වීමත් වැලැක්විය නොහැකි තත්ත්වයට පත් වේ. දේශපාලනඥයින්ගේ අවශ්‍යතාවලට බස්නාහිර පළාත තුළ අධ්‍යාපන නිලධාරින් කටයුතු කිරීම නිසා ප්‍රදේශය තුළ පාරිසරික හා නාගරික තදබදය ඇති වීම මෙන්ම ලඟම පාසල හොඳම පාසල කිරීමේ එවකට රජයේ ජාතික ප්‍රතිපත්තියට එය සෘජුවම බලපා ඇති බවද පෙනී යයි. 2016.09.02 දින ගන්නා ලද මෙම තීරණය මත **බස්නාහිර පළාතේ තෝරාගත් ජනප්‍රිය පාසල් බොහොමයකට දරුවන් නියමිත ක්‍රියාපටිපාටියක් අනුගමනය නොකර ඇතුළත් කර ගෙන ඇති බවත් බොහෝ පාසල් වල සමාන්තර පන්තියක් ඇති කර නොමැති බවටත් කරුණු අනාවරණය වේ.** මෙලෙස නීත්‍යානුකූල නොවන ආකාරයෙන් ළමුන් ඇතුළත් කිරීම නිසා අධිකරණය මගින් නියෝග කළ ළමුන් සංඛ්‍යාව ඉක්මවා ඇති බව පැහැදිලි වේ. SC/FR/232/11 ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුව ප්‍රකාරව පළමු ශ්‍රේණියේ සිට අ.පො.ස සා/පෙළ පන්තයක් තුළ ළමුන් සංඛ්‍යාව 35 ඉක්ම නොවිය යුතු විය.

එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන,සංස්කෘතික හා කලා කටයුතු ක්‍රීඩා හා යෞවන කටයුතු හා තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගේ බස්නාහිර පළාතේ තදබදය පවතින පාසල්වල පළමු ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම යන මැයෙන් නිකුත් කරන ලද 2016.07.26 දිනැති ලිපිය පරිදි 2016 වර්ෂයේදී බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් වූ සමාන්තර පන්තියක් වැඩිකිරීමට යෝජිත වූ පාසල් 21 පහත පරිදි වේ.

01. බප/ජය ආදර්ශ පිරිමි විද්‍යාලය
02. බප/ජය කොට්ටාව ධර්මපාල විද්‍යාලය
03. නුගේගොඩ සමුද්‍රදේවී බාලිකා විද්‍යාලය
04. පිළියන්දල සෝමවීර චන්ද්‍රසිරි විද්‍යාලය
05. රාවතාවත්ත මෙතෝදිස්ත විද්‍යාලය
06. අවිස්සාවේල්ල ජනාධිපති විද්‍යාලය
07. පාදුක්ක සිරි පියරත්න කනිෂ්ඨ විද්‍යාලය
08. සංඝමිත්තා බාලිකා විද්‍යාලය කොළඹ 08
09. ෆාතිමා මුස්ලිම් බාලිකා විද්‍යාලය මැද කොළඹ
10. අශෝක විද්‍යාලය කොළඹ 10
11. අල් කතිරියා මුස්ලිම් බාලිකා විද්‍යාලය මැද කොළඹ
12. ගම්පහ යශෝධරා බාලිකා විද්‍යාලය
13. අත්තනගල්ල රන්පොකුණුගම විද්‍යාලය
14. සපුගස්කන්ද විශාඛා විද්‍යාලය
15. මහර ධර්මදස්සි මහා විද්‍යාලය
16. පානදුර අගමැති බාලිකාව

17. පානදුර රාජකීය මහ විද්‍යාලය

18. කලුතර ඥානෝදය බාලිකා විද්‍යාලය

19. ඥාණිස්සර විද්‍යාලය දර්ගා නගරය

20. හොරණ තක්ෂිලා මහ විද්‍යාලය

21. මතුගම ශාන්ත මරියා මහ විදුහල

මෙම පාසල් 21 අතරින් සමාන්තර පන්ති වැඩි කරන ලද්දෙ ජනප්‍රිය පාසල් 18ක් සඳහා පමණක් බවට කරුණු අනාවරණය වන අතර බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ 2017.09.13 දිනැති ලිපිය මඟින් 2016 වර්ෂයේදී පාසල් 18ක පළමු ශ්‍රේණිය සඳහා වැඩිකරන ලද පන්තියට අයත් සිසුන් සංඛ්‍යාව හා නාම ලේඛණය කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එම පාසල් හා සිසුන් සංඛ්‍යාව පහත පරිදි වේ.

| | පාසල | වැඩි කරන ලද පන්තියට අයත් සිසුන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | බප/ක පානදුර අගමැති බාලිකාව | 13 |
| 2 | බප/ක ඥානෝදය බාලිකා විද්‍යාලය | 18 |
| 3 | බප/ක පානදුර රාජකීය මහ විද්‍යාලය | 30 |
| 4 | බප/හො තක්ෂිලා මහ විද්‍යාලය | 19 |
| 5 | බප/ජය ආදර්ශ පිරිමි විද්‍යාලය | 13 |
| 6 | බප/ජය ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලය | 20 |
| 7 | බප/ජය කොට්ටාව ධර්මපාල විද්‍යාලය | 40 |
| 8 | බප/පිළි ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය | 11 |
| 9 | බප/පිළි අංක 1 කනිෂ්ඨ විද්‍යාලය | 18 |
| 10 | රාවතාවත්ත මෙතෝදිස්ත විද්‍යාලය | 07 |
| 11 | බප/පිළි විද්‍යා විද්‍යාලය | 10 |
| 12 | බප/හෝ සිරි පියරත්න කනිෂ්ඨ විද්‍යාලය | 14 |
| 13 | බප/කො අශෝක විද්‍යාලය | 30 |
| 14 | බප/කො සංඝමිත්තා බාලිකා විද්‍යාලය | 20 |
| 15 | බප/කො කයිරා මුස්ලිම් බාලිකා විද්‍යාලය | 09 |
| 16 | බප/කැළ/විශාකා බාලිකා විද්‍යාලය | 25 |
| 17 | බප/හෝ/ජනාධිපති විද්‍යාලය අවිස්සාවේල්ල | 10 |
| 18 | නුගේගොඩ සමුද්‍රදේවී බාලිකා විද්‍යාලය | 21 |

ඒ අනුව යෝජිත පාසල් 21ට අයත් නොවන පාසල් 4ක් ද මෙම ලේඛනය තුළ අන්තර්ගත වන බව නිරීක්ෂණය වන අතර එය ගැටලු සහගත තත්වයක් වේ. එම පාසල් වන්නේ,

1. බප/ජය ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලය
2. බප/පිළි ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය
3. බප/පිළි අංක 1 කනිෂ්ඨ විද්‍යාලය
4. බප/පිළි විද්‍යා විද්‍යාලය

මේ අනුව සමාන්තර පන්ති වැඩි කරන ලද බවට වූ පාසල් 18හි විදුහල්පතිවරුන් කොමිෂන් සභාව වෙත කැඳවීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර ඒ අනුව බස්නාහිර පළාත් සභාවේ අදාළ පාසල් 16ක විදුහල්පතිවරුන් කොමිෂන් සභාව හමුවේ පෙනී සිටිමින් ලිඛිතව හා වාචිකව ප්‍රකාශ ලබා දී ඇත.

බප/පිළි ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලයේ විදුහල්පති වෙත 2017.10.24, 2017.11.08, 2017.11.17 යන දිනයන්හි කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස අවස්ථා තුනකදී සිතාසි සිතාසි මගින් දන්වා ඇතත් පැමිණීමට අපොහොසත්ව ඇත. බප/පිළි විද්‍යා විද්‍යාලයේ විදුහල්පති වෙත 2017.10.30, 2017.11.08, 2017.11.17 යන දිනයන්හි කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස අවස්ථා තුනකදී සිතාසි මගින් දන්වා ඇතත් පැමිණීමට අපොහොසත්ව ඇත.

බප/ක පානදුර අගමැති බාලිකා විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම හමුවේ පෙනී සිටිමින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ළමුන් 13 දෙනෙකුගේ නාම ලේඛනයක් තමා වෙත එවා තිබූ බවත් ඒ අනුව වෙනම පන්තියක් ආරම්භ නොකර පවතින පන්ති 4ටම එම සිසුන් 13 දෙනා ඇතුළත් කළ බවත් එම සිසුන් සඳහා වෙනම නාම ලේඛනයක් පවත්වාගෙන යන බවත් එක් පන්තියක සිසුන් ගණන 40 ඉක්මවා ඇති බවටත් කරුණු දක්වා ඇත.

බප/ක ඥානෝදය බාලිකා විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම හමුවේ පෙනී සිටිමින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ළමුන් 20 දෙනෙකුගේ නාම ලේඛනයක් එවා තිබූ බවත් ඒ අනුව වෙනම පන්තියක් ආරම්භ නොකර පවතින පන්ති 4ටම එම සිසුන් 20 දෙනා ඇතුළත් කළ බවත් එක් පන්තියක සිසුන් ගණන 45 පමණ සිටින බවටත් කරුණු දක්වා ඇත.

බප/ක පානදුර රාජකීය මහ විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම හමුවේ පෙනී සිටිමින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ළමුන් 30කගේ නාම ලේඛනයක් එවකට සිටි විදුහල්පති වෙත එවා තිබූ බවත් ඒ අනුව වෙනම පන්තියක් ආරම්භ නොකර පවතින පන්ති 6ටම එම සිසුන් 30 දෙනා ඇතුළත් කර ඇති බවත් එය තමාගේ වගකීමක් නොවන බවටත් කරුණු දක්වා ඇත. එමෙන්ම 2017 වර්ෂය සඳහා එසේ සමාන්තර පන්තියක් ඇති කිරීමට තමන් විරුද්ධ බවටත් ප්‍රකාශ කොට ඇත.

බප/හො තක්ෂිලා මහ විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම හමුවේ පෙනී සිටිමින් තම පාසලේ සමාන්තර පන්තියක් ආරම්භ කළ බවට කරුණු දක්වා ඇත. වෙනම ගුරුවරු හා වෙනම

නාමලේඛනයක් පවත්වාගෙන යන බවයි. එම පන්තිය 1 ශ්‍රේණිය එෆ් ලෙස නම්කර ඇත. එම පන්තියේ සිසුන් ගණන 19 බවත් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් එවන ලද නාම ලේඛනයේ සඳහන් ළමුන් 19 දෙනා පමණක් එම පන්තියේ ඉගෙනුම ලබන බවයි.

බප/ජය ආදර්ශ පිරිමි විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම හමුවේ පෙනී සිටිමින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ළමුන් 13 දෙනෙකුගේ නාම ලේඛනයක් එවා තිබූ බවත් ඒ අනුව වෙනම පන්තියක් ආරම්භ නොකර පවතින පන්ති 4ටම එම සිසුන් 13 දෙනා ඇතුළත් කළ බවට කරුණු දක්වා ඇත. ඒ අනුව පන්ති දෙකක ළමුන් 41 බැගින්ද අනෙක් පන්ති දෙකේ 42 බැගින්ද සිසුන් සිටින බවට කරුණු දක්වා ඇත.

බප/ජය ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම හමුවේ පෙනී සිටිමින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ළමුන් 20 දෙනෙකුගේ නාම ලේඛනයක් එවා තිබූ බවත් ඒ අනුව වෙනම පන්තියක් ආරම්භ නොකර පවතින පන්ති 4ටම එම සිසුන් 20 දෙනා ඇතුළත් කළ බවට කරුණු දක්වා ඇත. ඒ අනුව පන්තියක ළමුන් 45 බැගින් සිටින බවයි.

බප/ජය කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම හමුවේ පෙනී සිටිමින් සමාන්තර පන්තියක් ආරම්භ කළ බවට කරුණු දක්වා ඇත. බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ශ්‍රීලාල් නෝනිස් මහතා ළමුන් 40කගේ නාම ලේඛනයක් එවා තිබූ බවත් ඒ අනුව වෙනම පන්තියක් ආරම්භ කළ බවත්ය. ඒ අනුව එක් පන්තියක සිසුන් 40 බැගින් පන්ති 9ක් පවතින බවට ප්‍රකාශ කොට ඇත.

බප/පිළි අංක 1 කනිෂ්ඨ විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම හමුවේ පෙනී සිටිමින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ළමුන් 22 දෙනෙකුගේ නාම ලේඛනයක් එවා තිබූ බවත් එයින් 18 දෙනෙකු වෙනම පන්තියක් ආරම්භ නොකර පවතින පන්ති 4ටම ඇතුළත් කළ බවට කරුණු දක්වා ඇත. ඒ අනුව පන්තියක ළමුන් 40,41 බැගින් සිටින බවයි.

රාවතාවත්ත මෙතෝදිස්ත විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම හමුවේ පෙනී සිටිමින් ළමුන් දෙදෙනෙකුගේ නාම ලේඛනයක් 2017.09.13 දින බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ශ්‍රීලාල් නෝනිස් මහතා විසින් රැස්වීමකදී තමාට ලබා දුන් බවත්, නමුත් එම ළමුන් දෙදෙනා පාසලට නොපැමිණි බවටත් කරුණු දක්වා ඇත.

බප/හෝ සිරි පියරත්න කනිෂ්ඨ විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම හමුවේ පෙනී සිටිමින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ළමුන් 14 දෙනෙකුගේ නාම ලේඛනයක් තමා වෙත එවා තිබූ බවත් ඒ අනුව වෙනම පන්තියක් ආරම්භ කරත් ගුරුවරු නොමැති අවස්ථාවල පවතින පන්ති 4ටම එම සිසුන් 14 දෙනා ඇතුළත් කර ඉගැන්වීම් කටයුතු සිදු කරන බවට කරුණු දක්වා ඇත.

බප/කො අශෝක විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම හමුවේ පෙනී සිටිමින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ශ්‍රීලාල් නෝනිස් මහතා විසින් ළමුන් 23 දෙනෙකුගේ නාම ලේඛනයක් එවා තිබූ බවත් ඒ අනුව වෙනම පන්තියක් ආරම්භ කළත් සතියකින් පමණ එම ළමුන් 23දෙනා පවතින පන්ති වලටම ඇතුළත් කළ බවට කරුණු දක්වා ඇත. ඒ අනුව පන්තියක ළමුන් 46 බැගින් සිටින බවයි.

බප/කො සංඝමිත්තා බාලිකා විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම හමුවේ පෙනී සිටිමින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ළමුන් 22 දෙනෙකුගේ නාම ලේඛනයක් එවා තිබූ බවත් ඒ අනුව වෙනම පන්තියක් ආරම්භ කරත් පසුව මෙම ළමුන් 22 දෙනා පවතින පන්තිවලටම ඇතුළත්කර ඉගැන්වීම් කටයුතු සිදු කරන බවට කරුණු දක්වා ඇත. ඒ අනුව පන්තියක ළමුන් 40 බැගින් පන්ති 7ක් පවතින බවයි.

බප/කො කයිරා මුස්ලිම් බාලිකා විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම හමුවේ පෙනී සිටිමින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ළමුන් 10 දෙනෙකුගේ නාම ලේඛනයක් එවා තිබූ බවත් ඒ අනුව වෙනම පන්තියක් ආරම්භ නොකර මෙම ළමුන් 10 දෙනා පවතින පන්තිවලටම ඇතුළත්කර ඉගැන්වීම් කටයුතු සිදු කරන බවට කරුණු දක්වා ඇත.

බප/කැළ/විශාකා බාලිකා විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම හමුවේ පෙනී සිටිමින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ළමුන් 25 දෙනෙකුගේ නාම ලේඛනයක් එවා තිබූ බවත් ඒ අනුව වෙනම පන්තියක් ආරම්භ නොකර මෙම ළමුන් 25 දෙනා පවතින පන්තිවලටම ඇතුළත්කර ඉගැන්වීම් කටයුතු සිදු කරන බවට කරුණු දක්වා ඇත. නමුත් වෙනම නාම ලේඛනයක් පවත්වාගෙන යන බවයි.

බප/හෝ/ජනාධිපති විද්‍යාලය අවිස්සාවේල්ල විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම හමුවේ පෙනී සිටිමින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ළමුන් 10 දෙනෙකුගේ නාම ලේඛනයක් එවා තිබූ බවත් ඒ අනුව වෙනම පන්තියක් ආරම්භ නොකර මෙම ළමුන් 25 දෙනා පවතින 6ටම ඇතුළත්කර ඉගැන්වීම කටයුතු සිදු කරන බවට කරුණු දක්වා ඇත. නමුත් වෙනම නාම ලේඛනයක් පවත්වාගෙන යන බවයි.

නුගේගොඩ සමුද්‍රදේවී බාලිකා විද්‍යාලයේ විදුහල්පති විසින් කොමිසම හමුවේ පෙනී සිටිමින් බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ළමුන් 21 දෙනෙකුගේ නාම ලේඛනයක් එවා තිබූ බවත් ඒ අනුව වෙනම සමාන්තර පන්තියක් ආරම්භ කළ බවට කරුණු දක්වා ඇත. 2016.09.13 දින බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ශ්‍රීලාල් නෝනිස් මහතා විසින් රැස්වීමක් කැඳවා තිබූ බවත් එහිදී සමාන්තර පන්තියක් පටන් ගන්නා ලෙස දැනුම් දුන බවයි. පළමු වසර සඳහා පන්ති 5ක් පවතින බවත් එක් පන්තියක ළමුන් 40 පමණ වන බවයි.

මෙම විදුහල්පතිවරුන් 16 දෙනාගෙන් කිසිදු විදුහල්පතිවරයෙකු තම පාසලට 2016 වර්ෂය තුළ අමතර සමාන්තර පන්තියක් වැඩි කර දෙන ලෙස නීත්‍යානුකූලව ඉහළ අධ්‍යාපන බලධාරීන් වෙතින්

ඉල්ලා නොමැති බවට කොමිසම හමුවේ කරුණු දක්වා ඇත. එම ප්‍රකාශ අනුව අධ්‍යාපන අමාත්‍යංශයේ ඉහළ බලධාරීන්ගේ බලපෑම මත ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව ප්‍රකාරව නීත්‍යානුකූලව කටයුතු කිරීමට අපහසු බවටද ඔවුන් කරුණු දක්වා ඇත. ඔවුන් කොමිෂන් සභාවට ප්‍රකාශ කර ඇත්තේ බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක ශ්‍රීලාල් නෝනිස් මහතා විසින් සමාන්තර පන්තියක් ආරම්භ කරන ලෙස ලිපි යොමු කර ඇති බවත් 2016.09.20 වන දින වන විට එම පාසල් වලට බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් ඇතුළත් කරගතයුතු ළමුන්ගේ නාම ලේඛනයක්ද විදුහල්පතිවරුන් වෙත එවා තිබූ බවත්ය.

තවද 2016.09.20 වන දින බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පිළි/අංක1 විද්‍යාලයෙහි විදුහල්පති වෙත නිකුත් කළ ලිපිය තුළින් අසාධාරණයට ලක්වූ දරුවන් පිළිබඳ ලේඛනයක් ඉදිරිපත් කර ඇති බවත් එම දරුවන් සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටි හෝ පාසල පිහිටි පෝෂිත ප්‍රදේශය තුළ යන කරුණු දෙකෙන් එක් කරුණක් සම්පූර්ණ වන්නේ නම් ඇතුළත් කර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා ඇත.

**මේ අනුව තමන්ගේ ඉහල නිලධාරියාගේ ලිඛිත ඉල්ලීම මත පාසල් 16 න් පාසල් 3ක් හැර අනෙක් පාසල් 13ම සාමන්තර පන්තියක් වැඩි නොකර එවන ලද ලේඛනයේ ඇති ළමුන් පවතින පන්ති තුළටම ඇතුළත් කර ගෙන ඇති අයුරු නිරීක්ෂණය වේ. මේ අනුව පළමු වසරෙ එක් පන්තියක ශිෂ්‍ය සංඛ්‍යාව 40 ඉක්මවා ඇති බවත් ඔවුන් කොමිෂන් සභාවට ප්‍රකාශ කර ඇත. ඉදිරිපත්ව ඇති කරුණු අනුව සමාන්තර පන්තියක් ආරම්භ කර ඇත්තේ කොට්ටාව ධර්මපාල විද්‍යාලයෙත්, නුගේගොඩ සමුද්‍රදේවී බාලිකා විද්‍යාලයෙත්, හොරණ තක්ෂිලා විද්‍යාලයේත් පමණක් වේ. නමුත් එම පාසල් තුනෙහිද සමාන්තර පන්තියක් ඇති කර දරුවන් ඇතුළත් කර ඇත්තේ පාසැල්වලට දරුවන් ඇතුළත් කර ගන්නා විධිමත් ක්‍රමවේදයට නොවන බවත් ඉහළ බලධාරීන් විසින් යොමු කරන ලද දරුවන්ගේ නාම ලේඛනයට අදාළව එම සියලු දරුවන් පාසලට ඇතුළත් කර ඇති බවටත් කරුණු අනාවරණය වේ.**

විදුහල්පතිවරුන්ගේ ප්‍රකාශ අනුව පැහැදිලි වන්නේ බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ ඉල්ලීම මත මෙම පාසල්වලට දරුවන් ඇතුළත් කර ඇති බවත් ඔවුන් කිසිවිටෙකත් සමාන්තර පන්තියක් වැඩිකරන ලෙස අධ්‍යාපන බලධාරීන්ගෙන් ඉල්ලීමක් නොකරන ලද බවත්ය. මෙලෙස නීත්‍යානුකූල නොවන ආකාරයෙන් 2016 වර්ෂයේදී ජනප්‍රිය පාසල් 18කට ඇතුළත් කර ඇති ළමුන් පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පවත්වන ලෙස මානව හිමිකම් කොමිෂන් සභාවෙන් පැමිණිලිකරු විසින් කරන ලද ඉල්ලීම පරිදි මෙම කාරණය පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ගැඹුරින් අධ්‍යනය කර ඇත. තවද 2016 වසරේ පළමු වන ශ්‍රේණියට ඇතුළත් කර ගන්නා ලද ළමුන් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගන්නා ලෙසද පැමිණිලිකරු කොමිෂන් සභාවෙන් ඉල්ලා ඇත.

සාමාන්‍ය නීතිය තුළ සිදු වී ඇති හෝ චේතනාත්විතව සිදු කොට ඇති කිසියම් නීතියකට පටහැනි ක්‍රියාවක් හෝ ක්‍රියාවලියක් නිවැරදි කිරීමේ වගකීම රාජ්‍ය පාර්ශවයට පැවතිය යුතු නමුත් මෙම ප්‍රශ්න ගත සිද්ධි තුළ ළමයා යන සුවිශේෂී සිද්ධාන්තය මූලික වී ඇති බව හා සෘජුවම ළමයා යන සමාජ කොට්ඨාශයට මෙම නීත්‍යානුකූල කාර්යය බැඳී පැවතීම තුළ එවකට සිදුව ඇති මෙකී කරදරකාරී ක්‍රියාවලිය ඒ ආකාරයෙන්ම නිවැරදි කිරීමේ හැකියාවක් ඇත්ද යන්න ගැටලුව මතු වේ. නීතිය ක්‍රියාත්මක කිරීමේදී සමාජයේ සංවේදී සහ සුවිශේෂී කොටස් කෙරෙහි සුවිශේෂී වූ නීතිමය නම්‍යකරණයක් පැවතිය යුතු බව සමාජ පිළිගැනීම වේ. කෙසේ නමුත් 2016 වර්ෂයේ දී බස්නාහිර පළාතේ පාසල් 18ක් තුළට මෙසේ නිවැරදි නොවන ආකාරයට නීතියට පටහැනිව දරුවන් ඇතුළත් කොට තිබීමේ ක්‍රියාවලිය නිවැරදි කිරීමේ හැකියාවක් මේ වන විට නොමැත. යම් දරුවෙකු පාසලකින් ඉවත් කිරීම මගින් එකී දරුවාගේ අධ්‍යාපන අයිතිය, සමාජ අයිතිය මෙන්ම අනාගත අපේක්ෂාවක් කෙරෙහි එකී තීරණයේ බලපෑම් සෘජුව බලපාන බැවින් නීතියට පටහැනිව පාසල් වලට අතුළත් කරන දරුවන් පාසල් වලින් ඉවත් කිරීමෙන් නොව නැවත කිසි දිනක මෙවැනි වූ වරදක් ශ්‍රී ලංකා අධ්‍යාපන ක්‍රමය තුළ සිදු නොවිය යුතු බවට හා එවැනි වරදක් සිදු නොවන ලෙස වගබලා ගැනීමේ නෛතිකමය යුතුකම අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ පරිපාලනය තුළ පැවතිය යුතු බවට කොමිෂන් සභාව මගින් අවධානයට ලක් කරයි.

<u>නිගමනය :-</u>

එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික, කලා කටයුතු සහ යෞවන කටයුතු හා තොරතුරු තාක්ෂණය පිළිබඳ අමාත්‍යවරයා වන රංජිත් සෝමවංශ මහතා විසින් පළමු ශ්‍රේණිය සඳහා ළමුන් ඇතුළත් කිරීමේ චක්‍රලේඛනය ප්‍රකාරව පන්තියක ළමුන් සංඛ්‍යාව 40 ඉක්මවිය නොහැකි බැවින් අධික තදබදය පවතින පාසල් සඳහා අමතර පන්තියක් ලබා දීම අනුමත කරමින් එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත 2016.07.25 වන දින ලිඛිතව දන්වා ඇති අතර අමාත්‍යවරයාගේ එම නියෝගයේ නීතිමය ගැටලුවක් නිරීක්ෂණය නොවේ. නමුත් එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන අමාත්‍යවරයාගේ එම දැනුම්දීම මත එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන හා ක්‍රීඩා අමාත්‍යංශයේ ලේකම් වූ එස්.ජී. විජේබන්දු හා එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක පී. ශ්‍රීලාල් නෝනිස් යන නිළධාරීන් (2වන හා 3වන වගඋත්තරකරුවන්) හා එම නිලධාරීන්ගේ දැනුම්දීම පරිදි අදාළ පාසල්හි විදුහල්පතිවරුන් විසින් බස්නාහිර පළාත් සභාව තුළ යෝජිත පාසල් 18ක් අතරින් 15ක් සඳහා 2016 වර්ෂයේ පළමු වසරට සිසුන් ඇතුළත් කර ඇත්තේ සමාන්තර පන්තියක් ඇති නොකර පවත්නා පන්තිවලටම බවත්, එහිදී පාසල්වලට සිසුන් ඇතුළත් කරගන්නා සාමාන්‍ය ක්‍රමවේදයට පරිබාහිරව යමින් නිසි ක්‍රමවේදයකින් තොරව සිසුන් ඇතුළත් කර ගැනීම සිදු කර ඇති බවටත් කොමිෂන් සභාව වෙත කරුණු අනාවරණය වේ.

තවද සමාන්තර පන්තියක් ඇති කරන ලද පාසල් තුනෙහිද දරුවන් ඇතුළත් කර ඇත්තේ විධිමත් ක්‍රමවේදයට නොවන බවත් ඉහළ බලධාරීන් විසින් යොමු කරන ලද දරුවන්ගේ නාම ලේඛනයට

අදාළ සියලු දරුවන් එම පන්තියට ඇතුළත් කර ඇති බවටත් මෙම ක්‍රියාවලිය නිසාවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ 34/2015 චක්‍රලේඛනයේ එන එක් සමාන්තර පන්තියක සිටිය යුතු ළමුන් සංඛ්‍යාව 40ක් විය යුතුය යන්න උල්ලංඝනය කර ඇති බවත් නිරීක්ෂණය වේ.

මෙම ක්‍රියාදාමය තුළින් එනම්, සාමාන්‍ය ක්‍රමවේදයට පරිබාහිරව නිසි ක්‍රමවේදයකින් තොරව සිසුන් ඇතුළත් කර ගැනීම නිසා නිසි පරිදි අදාළ පාසල්වලට ඇතුළත් වීමට පොරොත්තු ලේඛනයන්හි සිටි දරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් වනවා මෙන්ම නිසි සම්පත් තක්සේරුවකින් තොරව දේශපාලකයින් විසින් යොමු කරන ලද නම් ලැයිස්තුවක් මත පදනම්ව දරුවන් පාසල් වලට ඇතුළත් කිරීම නිසා සුදුසු ගුරුවරුන් හෝ ශාලා පහසුකම් ආදියෙන් තොරව ප්‍රමාණවත් පහසුකම් නොමැතිව අධ්‍යාපනය ලැබීමට සිදු වීම මත එලෙස ඇතුළත් කළ දරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක්ද සිදු වී ඇත. ඒ බව මෙම කොමිෂන් සභාව හමුවේ අදාළ පාසල්හි ගුරුවරුන් විසින් ලබා දුන් ප්‍රකාශ අනුව වැඩිදුරටත් තහවුරු වන අතර සෑම විදුහල්පතිවරයෙකු විසින්ම ප්‍රකාශ කර ඇත්තේ පාසල් සතුව ප්‍රමාණවත් භෞතික හා මානව සම්පත් නොමැති වුවද තම ඉහළ නිලධාරීන්ගේ ඉල්ලීම් අනුව කටයුතු කිරීමට සිදු වූ බවය. තවද දේශපාලන පදනම මත මෙලෙස දරුවන් අදාළ පාසල් වලට ඇතුළත් කිරීම නිසා එම දේශපාලන මතවාදය නියෝජනය නොකරන වෙනත් දේශපාලන මතවාද දරණ පක්ෂවලට අයත් පිරිසගේ දරුවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමක්ද සිදු වී ඇති බව පෙනී යයි.

4 වන වගඋත්තරකරු වන එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විමල් ගුණරත්න මහතා විසින් ජනප්‍රිය පාසල්වල පළමුවන ශ්‍රේණිය සඳහා සමාන්තර පංතියක් වැඩි කිරීමේ තීරණය සුදුසු නොවන බවට හා එය රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට බාධාවක් වන බවට වගකිවයුතු බලධාරීන් දැනුවත් කර ඇති බැවින් එම නිලධාරියා හට මේ සම්බන්ධයෙන් වගකීමක් නොපැවරේ.

තවද එවකට බප/ක පානදුර අගමැති බාලිකාව, බප/ක ඥානෝදය බාලිකා විද්‍යාලය, බප/ක පානදුර රාජකීය මහ විද්‍යාලය, බප/හො තක්ෂිලා මහ විද්‍යාලය, බප/ජය ආදර්ශ පිරිමි විද්‍යාලය, බප/ජය ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලය, බප/ජය කොට්ටාව ධර්මපාල විද්‍යාලය, බප/පිළි ශාන්ත ජෝසප් බාලිකා විද්‍යාලය, බප/පිළි අංක 1 කනිෂ්ඨ විද්‍යාලය, රාවතාවත්ත මෙතෝදිස්ත විද්‍යාලය, බප/පිළි විද්‍යා විද්‍යාලය, බප/හෝ සිරි පියරත්න කනිෂ්ඨ විද්‍යාලය, බප/කො අශෝක විද්‍යාලය, බප/කො සංඝමිත්තා බාලිකා විද්‍යාලය, බප/කො සාහිරා මුස්ලිම් බාලිකා විද්‍යාලය, බප/කැළ/විශාකා බාලිකා විද්‍යාලය, බප/හෝ/ජනාධිපති විද්‍යාලය අවිස්සාවේල්ල, නුගේගොඩ සමුද්‍රදේවී බාලිකා විද්‍යාලය යන විද්‍යාලයන්හි විදුහල්පතිවරුන් විසින් පවතින නීතියට පටහැනිව බස්නාහිර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක හා ඉහළ නිළධාරීන්ගේ ඉල්ලීම අනුවම කටයුතු කර ඇති බවට කරුණු අනාවරණය වේ.

ඒ අනුව බස්නාහිර පළාත් සභාවට පමණක් නොව ලංකාවේ සියලුම පළාත් තුළ තිබෙන ජනප්‍රිය පාසල්වල පන්තිකාමර වලට නියමිත ළමයින් ප්‍රමාණය ඉක්මවා ඇතුලත් කිරීම නීත්‍යානුකූල

නොවන බවටත් එකී පන්ති සඳහා ළමුන් නීතියට පටහැනිව ඇතුළත් නොකළ යුතු බවත්, සමාන්තර පන්ති ඇති කරන්නේ නම් නිසි ක්‍රමවේදයන් අනුගමනය කළ යුතු අතර සම්පත් පිළිබඳව නිසි හා විධිමත් ක්‍රමවේදයන් අධ්‍යයනය කළ යුතු බවත් එසේ සමාන්තර පන්ති පිහිටුවන්නේ නම් හෝ ළමුන් ඇතුළත් කරන්නේ නම් එය සිදු කළ යුතු වන්නේ සාමාන්‍ය ක්‍රියාදාමයට අනුව පාසල් සඳහා ළමුන් ඇතුළත් කිරීමේ පටිපාටියට අනුව බව අවධාරණය කළ යුතුව ඇත. ඒ අනුව නිසි සුදුසුකම් හා අදාළ නිර්ණායක අනුව එක් එක් ගණයන් යටතේ සුදුසුකම් සපුරන සිසුන් ප්‍රමුඛතා පිළිවෙළට පාසල් සඳහා ඇතුළත් කර ගත යුතුව ඇත. සෑම දරුවෙකුටම පාසලක් හිමිවිය යුතු අතර එසේ වුවද සුදුසුකම් සපුරා ඇති දරුවන් සිටියදී අඩු සුදුසුකම් සහිත දරුවන් පාසල් වෙත ඇතුළත් කර ගැනීම අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛනයන්ට පටහැනිව ක්‍රියා කිරීමක් වන අතර එය අදාළ දරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක්ද වේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ 23/2013(11) චක්‍රලේඛයෙන් එක් සමාන්තර පන්තියක සිටිය යුතු සිසුන් සංඛ්‍යාව 35කට සීමා කළ අතර පසුව අධ්‍යාපන ලේකම්ගේ 34/2015 චක්‍රලේඛනයෙන් එම සීමාව 40 දක්වා ගෙන එන ලද අතර ඒ අනුව 2016 වර්ෂයේදී එක් සමාන්තර පන්තියක සිටිය යුතු ළමුන් සංඛ්‍යාව 40ක් විය. ඊට පසු වර්ෂවල සිසුන් ඇතුළත් කිරීමේදී වර්ෂයකට එක් සිසුවෙකු බැගින් අඩු කර 2021 හා ඉන් ඉදිරියට පන්තියක සිටිය යුතු සිසුන් සංඛ්‍යාව ක්‍රමයෙන් නැවත 35 බවට පත්විය යුතු බව දක්වා ඇත.

ඉහත සියලු කරුණු අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 12(1) වන ව්‍යවස්ථාව මගින් සුරක්ෂිත කොට ඇති නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද නීතියේ රැකවරණය ද සර්ව සාධාරණ විය යුතු බවට වූ පාසල් දරුවන්ගේ මූලික අයිතිවාසිකම 2වන සහ 3වන වගඋත්තරකරුවන් හා අදාළ පාසල්හි විදුහල්පතිවරුන් විසින් උල්ලංඝනය කර ඇති බව මෙයින් නිගමනය කරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් නිර්දේශ කර සිටී.

<u>නිර්දේශ</u>

1. දෙවන වගඋත්තරකරු වන එවකට බස්නාහිර පළාත් අධ්‍යාපන හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් එස්.ජී. විජේබන්දු මහතා මේ වන විටත් රාජ්‍ය සේවය තුළ යෙදී සිටී නම් ඔහු සම්බන්ධව සුදුසු විනය කටයුතු කිරීමට පියවර ගත යුතු බවත් අවශ්‍යතාවය පරිදි ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සමඟද සම්බන්ධීකරණය කළ යුතු බවටත් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිර්දේශ කරනු ලැබේ.

2. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක පී. ශ්‍රීලාල් නෝනිස් මහතා මේ වන විටත් රාජ්‍ය සේවය තුළ යෙදී සිටී නම් ඔහු සම්බන්ධව සුදුසු විනය කටයුතු කිරීමට පියවර ගත යුතු බවට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්වරයා වෙත නිර්දේශ කරනු ලැබේ.

3. සමාන්තර පන්තියක් ඇති නොකර පවත්නා පන්තිවලටම නීත්‍යානුකූල නොවන ආකාරයට දරුවන් ඇතුළත් කිරීමට කටයුතු කළ එවකට විදුහල්පතිවරුන් වන බප/ක පානදුර අගමැති බාලිකා විද්‍යාලයේ එම්.කේ.එම්.එන්. ප්‍රනාන්දු මිය, බප/ක ඥානෝදය බාලිකා විද්‍යාලයේ එල්.ඒ.අබේසිංහ මයා, බප/ක පානදුර රාජකීය මහ විද්‍යාලයේ කේ.ආර්.ප්‍රේමතිලක මයා, බප/ජය ආදර්ශ පිරිමි විද්‍යාලයේ එස්.පී. ගුණරත්න මයා, බප/ජය ශ්‍රී රාහුල බාලිකා විද්‍යාලයේ සී.කේ.වික්‍රමාරච්චි මිය, බප/පිළි අංක 1 කනිෂ්ඨ විද්‍යාලයේ ඩී.එම්.සෙනවිරත්න මයා, රාවතාවත්ත මෙතෝදිස්ත විද්‍යාලයේ ටී.එච්.රසංගිකා මිය, බප/හෝ සිරි පියරත්න කනිෂ්ඨ විද්‍යාලයේ එම්.එන්.බණ්ඩාර මයා, බප/කො අශෝක විද්‍යාලයේ වයි.යසරත්න මහතා, බප/කො සංඝමිත්තා බාලිකා විද්‍යාලයේ ඒ.ටී.ඩී ද සිල්වා මිය, බප/කො කයිරා මුස්ලිම් බාලිකා විද්‍යාලයේ ඒ.එල්.එස්. නසීර් මිය, බප/කැළ/විශාකා බාලිකා විද්‍යාලයේ ප්‍රියන්ති සමරවීර මිය, බප/හෝ/ අවිස්සාවේල්ල ජනාධිපති විද්‍යාලයේ එල්.ඩී.එස්.පී.සමරතුංග මයා, යන විදුහල්පතිවරුන්ට හා සමාන්තර පන්තියක් ඇති කර නීත්‍යානුකූල නොවන ආකාරයට එම පන්තිය තුළට දරුවන් ඇතුළත් කරන ලද බප/හො තක්ෂිලා මහ විද්‍යාලයේ කේ.ආර්.වයි.එම්.ජේ.ඩී.අබේරත්න මයා, බප/ජය කොට්ටාව ධර්මපාල විද්‍යාලයේ යූ.එම්.ප්‍රසන්න උපශාන්ත මයා, බප/ජය නුගේගොඩ සමුද්‍රදේවී බාලිකා විද්‍යාලයේ ඕ.පී.ආර්.එම්.එස්. ජයවර්ධන මිය යන විදුහල්පතිවරුන් මේ වන විටත් රාජ්‍ය සේවය තුළ යෙදී සිටී නම් ඔවුන් සම්බන්ධව සුදුසු විනය කටයුතු කිරීමට පියවර ගත යුතු බවට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිර්දේශ කරනු ලැබේ.

4. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු අංක SC/FR/232/11 හි තීන්දුව ප්‍රකාරව පන්ති කාමරයක සිටිය යුතු උපරිම සිසුන් සංඛ්‍යාව 35 විය යුතු වුවත් එකී සීමාව ඉක්මවා පන්ති කාමරවල සිසුන් සිටින බවට මෙම විමර්ශණයේදී කරුණු හෙළි වී ඇති ඇත. ඒ අනුව පන්ති කාමරයක සිටියයුතු උපරිම සිසුන් සංඛ්‍යාව 35 නොඉක්මවීමට සුදුසු වැඩපිළිවෙලක් යෙදීමට අධ්‍යාපන බලධාරීන් වගබලාගතයුතු බවට නිර්දේශ කරනු ලැබේ.

2026. 02. 26 ......................... දිනට පෙර මෙම නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශය ලේකම්, වෙත මෙයින් දන්වා සිටිමු.

**එල්.ටී.බී.දෙහිදෙණිය,**
**ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)**
**සභාපති**
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**නිමල් ජී පුංචිහේවා**
**කොමසාරිස්**
**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් 01. අමාත්‍යතුමා - දැ.ගැ.ස
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය,බත්තරමුල්ල.

02. ලේකම් - අ.ක.ස
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය,බත්තරමුල්ල.

03. ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - අ.ක.ස
නිදහස් චතුරශ්‍රය,කොළඹ 07.

04. සභාපති -අ.ක.ස
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 1200/9, රජමල්වත්ත පාර
බත්තරමුල්ල.

05. සභාපති - අ.ක.ස
බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 628, 10 වන මහල
ජන ජය සිටි ගොඩනැගිල්ල,රාජගිරිය.

06. ප්‍රධාන ලේකම් (බස්නාහිර පළාත) - අ.ක.ස
නො:204, බස්නාහිර පළාත් කාර්යාල සංකීර්ණය
4 වන මහල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.